# උසට හැදෙන පර්ණාංග

තෙතමනය සහිත සෙවණැති ස්ථාන ප්‍රිය කරන පර්ණාංග නැතහොත් මීවන ශාක බොහෝ විට අපට දකින්නට ලැබෙන්නේ කෙටි අපහැදිලි කඳකට සවි වූ පත්‍ර කිහිපයකින් යුතු කුඩා පඳුරු විලසිනි. මේ ආකාරයෙන් දකින මීවන විශේෂ බොහොමයක් විසිතුරු පැළෑටි ලෙසට ජනප්‍රිය වී ඇත්තේ ඒවා සිත් ඇදගන්නා සුලු රූපාකාරයෙන් යුක්ත වන නිසාය. අප නිතර දෙවේලේ දකින කුඩා මීවන පඳුරුවලට වඩා විශාල, දැකුම්කලු, ඊට හාත්පසින් ම රූපාකාරයෙන් වෙනස් වූ මීවන විශේෂ කිහිපයකින් ගස් පර්ණාංග (tree ferns) ලෙසට පහත දැක්වෙන අයුරින් ඔබට හඳුන්වා දිය හැකිය.



ගස් පර්ණාංග



මීවන ශාකවල දැකිය හැකි කුණ්ඩලාකාර ප්‍රාක් පත්‍රනය

ගසක් ලෙසට අප හඳුන්වන්නේ පැහැදිලි, කාෂ්ඨීය, සෘජු කඳක් සහිත ශාකයක් බැවින් ගස් පර්ණාංගවලද පැහැදිලි සෘජු කඳක් දැකිය හැකිය. එහෙත් මෙහිදී කඳින් අතු බෙදීමක් දැකගත නොහැකිය. ඒ වෙනුවට පත්‍ර රාශියක් ශාක කඳ මුදුනේ සවි වී තිබෙනු දැකිය හැකි අතර පර්ණාංගවලට පොදු ලක්ෂණයක් වන කුණ්ඩලාකාර ප්‍රාක් පත්‍රනය, නැතහොත් දලු ළාබාල කාලයේ දී වකුටු වී තිබී වැඩෙන විට ක්‍රම ක්‍රමයෙන් දිගහැරීම මෙහි දී ද පහසුවෙන් දැකගත හැකිය. අනිකුත් මීවන වර්ගවල මෙන් ම මේවායේ ද පත්‍රය තනි සරල පත්‍රයකින් සමන්විත නොවේ. ඒ වෙනුවට ඉතා කුඩා කොටස්වලට වෙන්වී බෙදී ගිය ස්වරූපයක් පෙන්නුම් කරයි. මෙලෙස දිස්වන පර්ණාංග ගස් අඩි 10-20 පමණ උසකට වැඩෙන විට එය කුඩා පොල් ගසක් මෙන් ඈතට පෙනෙනු ඇත.

දුලබ ගස් පර්ණාංග විශේෂ කිහිපයකින් පමණක් සමන්විත වන අතර *Cyathea* විශේෂය

අනිත්වාට වඩා වැඩි පැතිරීමක් පෙන්වයි. හක්ගල, නකල්ස්, පට්ටිපොළ, ඔහිය වැනි උස් කඳුකර බිම් ප්‍රදේශවල දී පර්ණාංග නිදහසේ වැඩෙනු දැකගත හැකිවෙයි. මීට අමතර ව පහතරට වැසි වනාන්තර ජලාශ්‍රිත ප්‍රජාවේද *Cyathea* සමහරවිට දී දැකගත හැකිය. එහෙත් ඒවා එතරම් උස්නොවුණු ශාක වේ.

මීවන ශාක හෙවත් පර්ණාංග ව්‍යාප්තිය සිදුවන්නේ පත්‍රවල යටි පැත්තේ දුඹුරු පැහැති පැල්ලම් ලෙස දැකිය හැකි ස්ථානවල හටගන්නා බීජාණු මගිනි. මේවා සුළගේ පාවී තෙතමනය සහිත සුදුසු උපස්ථරයක් හමු වූ විට දී ප්‍රරෝහණය අරඹයි. එබැවින් මීවන (ගස් මීවන ද ඇතුළුව) බීජ ශාක ගණයට ඇතුළත් කළ නොහැකිය. මේවා අප නිතර දකින ශාකවලට වඩා විශේෂිත ලක්ෂණ පෙන්නුම් කරන බව ඔබට දැන් පැහැදිලි වනු ඇත. එසේ වන්නේ මිහිතලය මත ශාක පරිණාමය වීමේ දී බීජ ශාකවලට කලින් මීවන වර්ග බිහිවී ඇති බැවිනි.

කඳුකරයේ ආශ්චර්යයක් ලෙස දැකගත හැකි ගස් පර්ණාංග ශාක පහත ඡායාරූපයෙන් ඔබට දැක බලාගත හැකිය. ගස් පර්ණාංගවල සුන්දර රූපාකාරය පරිසරයට කොතරම් විසිතුරුමය වටිනාකමක් ලබා දෙන්නේ දැයි ඔබට දැන් පැහැදිලි වනු ඇත.



ගස් පර්ණාංග (*Cyathea* විශේෂය)